# ක්ෂුද්‍ර මූල්‍ය

## ශ්‍රී ලංකාවෙහි ක්ෂුද්‍ර මූල්‍යායතන නෛතික පාලනය උදෙසා ...




සංවාද
SANVADA
சம்வாதம்

ප්‍රකාශනය - 02


### හැඳින්වීම

ක්ෂුද්‍ර ව්‍යාපාර ණය ක්‍රමය යනු ඉතා කුඩා පරිමාණ මූල්‍ය හෝ ඉතුරුම් ක්‍රමයක් ලෙස දුප්පත් ජනතාව වෙත මූල්‍ය සහන ලබා දෙන්නා වූ සේවාවකි. එකී ණය ලබා දෙන්නා වූ මූලාශ්‍රය පදනම් කර ගෙන ක්ෂුද්‍ර මූල්‍යාතන තුන් ආකාරයකට වර්ග කල හැක.

- පිටස්තර පුද්ගලයන් ගේ මුදල් යොදාගෙන ණය දෙන ආයතන.
- සිය සාමාජිකයන් ගේ මුදල් යොදාගෙන සාමාජිකයනට ම ණය දෙන විධිමත් ආයතන.
- මහජනතාව ගෙන් ලබාගත් මුදලින් ණය දෙන ආයතන යනුවෙනි.

ක්ෂුද්‍ර ව්‍යාපාරයන්හි පරාසය විවිධාකාර ව්‍යාපාරයන් දක්වා පුළුල් වීම හේතු කොටගෙන යම් ආකාරයක නියාමනයක් හෙවත් විධිමත් කිරීමක අවශ්‍යතාව මතු වී තිබේ. ක්ෂුද්‍ර මූල්‍යායතනයන් සඳහා බලපත්‍ර ලබා දෙමින් ඒවා අධීක්ෂණය කිරීම විෂයෙහි ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අවධානය යොමු වී ඇත්තේ මෙම සංකීර්ණ අවශ්‍යතාව ඉටු කිරීම සඳහා ය.

### ක්ෂුද්‍ර මූල්‍යායතන විධිමත් කිරීමක් අවශ්‍ය ද?

ක්ෂුද්‍ර මූල්‍යකරණය ද සමස්ත මූල්‍ය ක්‍රියාවලියට ම ඒකාබද්ධ කිරීම ඇතැම් රටවල පිළිවෙතයි. දැඩි නියාමන පිළිවෙළක් තුළින් ක්ෂුද්‍ර මූල්‍යකරණය වඩාත් ආරක්ෂා සහගත කැරෙන නමුදු නියාමනය දැඩි වීම හේතු කොටගෙන පහත දැක්වෙන තත්ත්වයන් ඇති නො වන සේ මෙම කාර්යය ඉටු කළ යුතුව තිබේ.

- ක්ෂුද්‍ර මූල්‍යකරණයෙහි එක් ප්‍රධාන අරමුණක් වූ දරිද්‍රතාව පිටු දැකීම විෂයෙහි සෘණාත්මක බලපෑමක් ඇති වීම.
- මෙම විෂයය හා අදාළ නව චින්තනයන් හි පහළ වීමට බාධා ඇති වීම.
- ප්‍රධාන මූල්‍ය ආයතනයන් හි වස්තුභංගත්වයන් ඇති වීම නිසා විශ්වාසය පළුදු වීම තුළින් මූල්‍ය පද්ධතියෙහි බිඳ වැටීමක් සිදු වීම.

මෙරට මූල්‍ය ක්ෂේත්‍රයෙහි ක්ෂුද්‍ර මූල්‍ය අංශය අසංවිධානාත්මක ය. අවිධිමත් ය. අසමරූපී ය. ඒවා අතර සහ සම්බන්ධතා ප්‍රමාණවත් නැත. මෙම දුබලතාවන් පිටු දැකීමට හෝ ක්ෂුද්‍ර මූල්‍යකරණයෙහි යෙදෙන රාජ්‍ය නොවන සංවිධානයන් විධිමත් මූල්‍ය ආයතන බවට පත් කරවීමට හෝ පැහැදිලි වැඩ පිළිවෙළක් වර්තමාන නෛතික හා නියාමන ක්‍රමවේදයන් තුළින් සැපයෙන්නේ නැත. සමූපකාරයන් ද ප්‍රමාණවත් නියාමනයකට හසු නොවේ. මෙවැනි තත්ත්වයන් යටතේ තැන්පත්කරුවන් ගේ සුරක්ෂිතතාව සහ ස්ථාවරත්වය ලබා දෙමින් ශීඝ්‍ර වර්ධනයක් කරා යාමට මෙකී ආයතනයන්ට නො හැකි බව නව නීති රීතින් හි අවශ්‍යතාව පෙන්වා දෙන්නෝ කියති. එහෙත් ශ්‍රී ලංකා මහ බැංකුවට අවශ්‍ය ආකාරයේ නියාමනයක හා අධීක්ෂණයක අවශ්‍යතාවක් ක්ෂුද්‍ර මූල්‍යායතනයන්ට තිබේ ද යන්න විවාදාත්මක ය.


pathfinder Foundation

ආර්ථිකය මුළුමනින් හසුරුවන බැංකු ව්‍යාපාරයට සමානුපාතිකව ශ්‍රී ලංකාවෙහි ක්ෂුද්‍ර මූල්‍ය අංශයට ලැබෙන්නේ ඉතා ම කුඩා ස්ථානයකි. මෙරට මූල්‍ය ක්ෂේත්‍රය විෂයෙහි බලපෑමක් ඇති කිරීමට විශාලතම ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන්ට වුව ද හැකියාවක් නැත.

තැන්පත්කරුවන් ගේ අරමුදල් සුරක්ෂිත කිරීම්වස් තැන්පතු ආරක්ෂක අරමුදලක් පිහිටුවීමට ද යෝජිත ය. ක්ෂුද්‍ර මූල්‍යායතනයන් විසින් සාමාජික නො වන්නවුන් ගෙන් තැන්පතු ලබා ගැනෙන අවස්ථා විරලය. විධිමත් බැංකු අංශයක් ශක්තිමත්ව ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවෙහි ක්ෂුද්‍ර මූල්‍යායතනයන් හි මුදල් තැන්පත් කිරීමට සාමාජික නො වන්නවුන් විශාල ලෙස පෙළැඹේ ද යන්න සැක සහිත ය.

ක්ෂුද්‍ර මූල්‍යායතනයන් අතර තරඟකාරිත්වයක් පවත්වාගෙන යාම යෝජිත නීති රීතීන් හි තවත් අරමුණකි. තරඟකාරීත්වයක් නිර්මාණය වන්නේ නිදහස් වෙළෙඳපොළ ක්‍රමයක දී බව අර්ථශාස්ත්‍රඥයන් ගේ මතයයි. මෙකී අරමුණ වෙනත් ක්‍රමවේදයන් ඔස්සේ ඉටු කරගත හැකි ය.

තැන්පත්කරුවන් ගේ ආරක්ෂාව ද සලසමින්, අරමුදල් සපයන්නන් ගේ අපේක්ෂාවන්ට සරිලන සේ ඒවා ආයෝජනය වන බවට වග බලාගැනීමක් යෝජිත නියාමනයන් තුළින් ඉටු නො වීම ද අභාග්‍යයකි.

මෙකී ආයතනයන් වෙත බලපත්‍ර නිකුත් කිරීමට යෝජිතව ඇත්තේ එම ව්‍යාපාරයට අවතීර්ණ වන්නන් ගේ විශ්වසනීයත්වය තහවුරු වීම පිණිස ය. කාර්යසාධන ප්‍රමිතීන් හෝ වාර්තා සැපයීමේ අවශ්‍යතාවන් හෝ යෝජිත නීති සම්පාදනයන් හි නො දැක්වේ. ව්‍යාපාර ප්‍රවර්ධනය වැනි අරමුණු ද ඉන් ඉටු වන බවක් නො පෙනේ. නියාමනය හේතු කොටගෙන ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයෙහි වර්ධනයකට වඩා අරමුදල් ප්‍රවාහයන්ට බාධා පමුණුවමින් වර්ධනය සීමා කරවීමක් සිදු වන බව මෙවැනි ආයතනයන් හි පාර්ශ්වකරුවන් (Stakeholders) මෙන් ම ඇතැම් ප්‍රවීණයෝ ද වටහාගෙන සිටිති.

ක්ෂුද්‍ර මූල්‍යකරණ ව්‍යාපාරය වර්ධනය වෙමින් පවතින මෙම අවධිය එයට දැඩි නියාමනයන් පැනවීම සඳහා ඉක්මන් වැඩි බවත්, දත්ත රැස්කිරීම පහසු කරවීම සහ අධීක්ෂණය සඳහා පමණක් වූ සුළු නියාමන ක්‍රමයක් හොඳට ම ප්‍රමාණවත් බවත් නියාමන හිතෛෂී නොවන පාර්ශ්වකරුවන්ගේ මතයයි.

නියාමනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් පහත සඳහන් වියදම් දැරීමට ද ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයන්ට සිදුවනු ඇත.

- වාර්ෂික අධීක්ෂණ ගාස්තු
- බලපත්‍ර ලබා ගැනීමේ ගාස්තු හා වාර්ෂික බලපත්‍ර ගාස්තු.
- සීමිත සමාගම් වශයෙන් දැරීමට සිදුවන වාර්ෂික විගණන පිරිවැය.
- විවෘත කෙරෙන සෑම අලුත් ශාඛාවක් වෙනුවෙන් ම ගෙවිය යුතු ගාස්තු.
- වාර්තා සැපයීමේ අවශ්‍යතා සඳහා යෙදැවෙන කාලය, ශ්‍රමය හා සම්පත් වෙනුවෙන් වූ පිරිවැය.
- ද්‍රවශීල වත්කම් අනුපාතය රැක ගැනීම පිණිස ද්‍රවශීල සහ පොලී නො ඉපැයෙන වත්කම් පවත්වා ගෙන යාමේ ආවස්ථික පිරිවැය.

ඉහත සඳහන් පිරිවැය ණය ලබා ගන්නන් මත පැටවීමට ක්ෂුද්‍ර මූල්‍යායතනයන්ට සිදු වීම වැළැක්විය නො හැකි ය. ඒ අනුව ණය ලබාගන්නන් ගේ පිරිවැය ඉහළ යන බැවින් දරිද්‍රතාව පිටුදැකීමේ අරමුණට එයින් බාධා සිදු වනවා පමණක් නොව මහජන විරෝධතාවන් මතු වීමට ද බොහෝ ඉඩ තිබේ.

## නම්‍යශීලී නො වීම.

පොලී අනුපාත, සුරැකුම් සහ ණය දීමේ අභ්‍යන්තර ක්‍රියාවලීන් යන අංශයන් හි නම්‍යශීලී බව ද ණය ලියකියවිලි, ණය වර්ගීකරණය, ණය අහිමි වීම් හා කපා හැරීමේ ප්‍රතිපාදනයන් හි සරල බව ද ආරක්ෂා කිරීමේ වැඩපිළිවෙළක් යෝජිත නීති සම්පාදනයන් හි දක්නට නැත. තැන්පතු සඳහා ගෙවන හා ණය සඳහා අය කැරෙන උපරිම පොලී අනුපාතයන් ද සුරැකුම්වල ප්‍රමාණය හා ස්වභාවයන් ද වැනි මූලික ප්‍රතිපත්තීන්ට ද යෝජිත කෙටුම්පත අනුකූල නොවේ. ආයෝජන ක්‍රම පිළිබඳව එහි සඳහන් රීති හා කොන්දේසි වෙළෙඳපොළ හිතෛෂී බවින් තොර ය.

## නිගමන

ණය දීමෙහි ම පමණක් නිරත සංවිධාන, සාමාජිකයන් සතු ස්වයංපාලිත සංවිධාන, රාජ්‍ය නොවන සවිධාන සහ රාජ්‍ය අරමුදල්වලින් යැපෙන ආයතන ආදී වූ මූල්‍ය ක්ෂේත්‍රයෙහි සියලු ම ක්ෂුද්‍ර මූල්‍යායතන කෙරෙහි බලපාන පොදු නියාමන පද්ධතියක් යොදා ගැනීම යෝග්‍ය නො වන්නේ ය.

රට තුළ බහුලව ක්‍රියාත්මකව පවතින සකසුරුවම් හා ණය දෙන සමූපකාර සමිති කෙරෙහි මෙකී පනත් කෙටුම්පතෙහි අවධානය යොමු නොවීම බලවත් අඩුපාඩුවකි. ජනතා මට්ටමින් ක්‍රියාත්මක වෙමින් වැදගත් භූමිකාවක යෙදෙන ක්ෂුද්‍ර මූල්‍යායතනයන් ද මෙම කෙටුම්පතෙහි දී නො සලකා හරිනු ලැබ තිබේ.

අවම ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳව සාධාරණත්වයක් යෝජිත කෙටුම්පත තුළින් ඉටු වී තිබීම සම්බන්ධයෙන් සතුටු විය හැකි ය. නිශ්චිත ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගැනීම තුළින් ක්ෂුද්‍ර මූල්‍ය වෙළෙඳපොළට අවතීර්ණ වීමේ හැකියාව සංවිධානයන් වැඩි ගණනකට ලැබී තිබීම ධනාත්මක ප්‍රතිඵල ගෙනෙන්නකි.

## නිර්දේශ

- නියාමන ව්‍යුහය සකස් කළ යුත්තේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයෙහි විශේෂ ලක්ෂණ මෙන් ම එහි ක්‍රියාකාරකම් පිළිබඳව අවබෝධයකින් යුතුව ය. ණය දීමෙහි පමණක් නිරත රාජ්‍ය නොවන සංවිධානයන් සඳහා අවශ්‍ය වන්නේ ඉතා සීමිත නියාමන ක්‍රියාදාමයක් වීම ඊට උදාහරණයකි.
- යෝජිත නියාමන මග පෙන්වීම් සහ අධීක්ෂණ ක්‍රම සංශෝධනය කිරීම පිණිස ක්ෂුද්‍ර මූල්‍යායතනයන් හි අවදානම් පැත්ත විමසීමට භාජන කළ යුතු ය.
- ප්‍රජා සංවර්ධනය සහ සමාජ ප්‍රගමනය වැනි ක්ෂුද්‍ර මූල්‍යකරණ සේවාවන් ද ආවරණය කැරෙන ප්‍රතිපාදනයන් පනත් කෙටුම්පතෙහි ඇතුළත් වීම අවශ්‍ය ය.

- අධීක්ෂණ පිරිවැය සහ එහි ප්‍රතිලාභ පිළිබඳව ද වැඩි අවධානයක් නීති සම්පාදනයේ දී යොමු වී තිබිය යුතු ය.
- ක්ෂුද්‍ර මූල්‍යායතන සතුව පවතින්නේ, මූල්‍ය ක්‍රමය තුළ වූ සමස්ත තැන්පත් ප්‍රමාණයෙන් ඉතා කුඩා ප්‍රතිශතයක් වන හෙයින් මෙන් ම, ඒවායෙහි තැන්පත්කරුවන් ද සාමාජිකයන් ම වන හෙයින්, එවැනි ආයතන අධීක්ෂණයන්ට භාජන කරවීම යෝග්‍ය නො වන්නේ ය.
- ක්ෂුද්‍ර මූල්‍ය සේවාවන් හි නිරත වීමේ අවස්ථාව යෝජිත නීති සම්පාදනය තුළින් වර්තමාන විධිමත් මූල්‍ය ආයතනයන්ට ද ලබා දිය යුතු ය.
- බොහෝ ක්ෂුද්‍ර මූල්‍යායතනයන් නිරත වන්නේ සුරකුම් රහිත ණය ප්‍රදානයන් හි වන බව යෝජිත නියාමන ව්‍යුහය සැකසීමේ දී අවධානයට යොමු විය යුතු ය.
- ණය ලියකියවිලි සහ වාර්තා සැපයීමේ අවශ්‍යතාවන් නම්‍යශීලී මෙන් ම සරල ද විය යුතු ය.
- ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍ර නිලධරයන් ගේ භූමිකාවට ද නීති සම්පාදනයේ දී පිළිගැනීමක් ලැබිය යුතු ය.
- පොලී අනුපාත නියාමනය හඳුන්වා දීමේ දී, ක්ෂුද්‍ර මූල්‍යායතනයන් හි සංවර්ධනයේ ප්‍රවර්ත්‍යතාව මෙන් ම දරිද්‍රතාවෙහි ගැඹුර ද පිළිබඳ නියාමන බලධාරීන් ගේ අවධානය යොමු වීම අවශ්‍ය ය.
- ශාඛා විවෘත කිරීම සහ වැසීම හා අදාළව පනවනු ලැබ තිබෙන සීමාවන් සැලකිල්ලෙන් යුතුව විමර්ශනයට භාජන කළ යුතු ය.
- අධීක්ෂණ බලධාරීන් පත් කිරීමේ දී දේශපාලන බලපෑම්වලට ඉඩ නො තැබෙන සේ ප්‍රවේසමින් කටයුතු කළ යුතු ය.
- ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්ට මෙන් නියාමන සහ අධීක්ෂණ නිපුණතාවන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සතුව නො තිබිය හැකි බැවින් සම්මත ගිණුම්කරණ සහ විගණන ශිල්ප ක්‍රම ක්ෂුද්‍රමූල්‍ය නියාමනයෙහි දී යොදා ගැනීම ද යෝග්‍ය නැත.
- බොහෝ ක්ෂුද්‍ර මූල්‍ය ආයෝජනයන් පැමිණෙන්නේ විවිධාකාර රාජ්‍ය නොවන සංවිධානයන් හරහා වන හෙයින් විදේශීය හිමිකාරත්ව සීමාවන් මෙන් ම උපරිම කොටස්හිමිකාරත්ව ප්‍රතිශතයන් ද දක්වනු ලැබ තිබිය යුතු ය.

මෙම සන්නිවේදන පත්‍රිකාව ආචාර්ය එස්. පී. ප්‍රේමරත්න මහතා විසින් 2007 අප්‍රේල් මස 27 වන දිනදා පැවති ප්‍රජා රැස්වීමේදි ඉදිරිපත් කරන ලද විශ්ලේෂණාත්මක ලේඛණය පදනම් කර ගෙන සකස් කරන ලද්දකි මෙම පත්‍රිකාව සකස් කිරීමේදි ප්‍රකාශයට පත්ව තිබෙන ලේඛන තුළින් ද, ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාරයෙහි හා ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායයන් හි නිරත වන්නන් හා ප්‍රවීණයන් සමඟ කැරුණු සාකච්ජාවන් ඔස්සේ ද මෙම අධ්‍යයනය සඳහා තොරතුරු ලබා ගැනිණ.

## කර්තෘ ගැන...

ආචාර්ය එස්.පී ප්‍රේමරත්න කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරයෙකි. මොහු ප්‍රථම උපාධිය හා විද්‍යාපති උපාධිය කොළඹ විශ්ව විද්‍යාලයෙන්ද, දර්ශනවේදි උපාධිය කළමනාකරණය පිළිබඳ මාස්ට්‍රිච්ට් (Maastricht) විශ්ව විද්‍යාලයෙන්ද, දර්ශනපති උපාධිය නෙදර්ලන්තයේ එන්ඩොවන් විශ්ව විද්‍යාලයෙන් ද ලබා ඇත.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ආර්ථික විද්‍යාව(ස්ත්‍රී පුරුෂ සමාජභාවි අයවැය) ක්ෂුද්‍ර මූල්‍යාතන, ව්‍යවසායකත්වය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා සමාජජාල විග්‍රහය යන අංශ පිළිබඳ මොහු තමාගේ ප්‍රධාන පර්යේෂණ කටයුතු වල යෙදෙයි.

# සංවාද...

ශ්‍රී ලංකාවෙහි සමාජ-ආර්ථික සංවර්ධනයෙහි ලා වැදගත් වන්නා වූ වර්ධනයන් පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදකයන් වන පාර්ලිමේන්තුව ද එසේ ම ජන සමාජ කණ්ඩායම් ද පොදු ජනතාව ද අතර පර්යේෂණාත්මක හා සාධනීය සංවාදයන්ට සහයෝගීව මැදිහත් වෙමින් උත්ප්‍රේරණීය (catalytic) කාර්යයන් හි නියැලීම, ලාභාපේක්ෂා රහිත හා අපක්ෂපාතී ආයතනයක් වන පාත්ෆයින්ඩර් පදනමෙහි මෙහෙවරයි.

පාත්ෆයින්ඩර් පදනමෙහි සංවාද වැඩසටහන දියත් කෙරෙන්නේ ශ්‍රී ලාංකීය සමාජයට හා ආර්ථිකයට බලපාන ආකාරයෙන් යෝජිතව හා අපේක්ෂිතව ඇති ව්‍යවස්ථාමය පියවරයන් පිළිබඳව පාර්ලිමේන්තුව තුළ මෙන් ම ඉන් බැහැරව ද හරවත් විවේචනාත්මක විශ්ලේෂණයන් හා සංවාදයන් ඇති කරවීම පිණිසයි.

ජනතාව ගේ යහ පැවැත්ම විෂයෙහි අතිශයින් වැදගත් වන්නා වූ වර්තමාන හා ක්‍රියාත්මක කිරීමට තිබෙන අණපනත් මත වූ ලේඛණයන් සංවාද වැඩසටහන මගින් සකස් කැරෙයි. අදාළ විෂයයෙහි ප්‍රවීනයන් විසින් සකසනු ලබන මෙකී ලේඛණයන් හි අවසාන නිමැවුම එළි දකින්නේ සූක්ෂම විමර්ශනයන්ට හා ප්‍රජා රැස්වීම්වල දී දිගු සාකච්ඡාවන්ට භාජන කිරීමෙන් අනතුරුව ය. සංක්ෂේපනයන් ගෙන් හා සංස්කරණයන් ගෙන් පසුව ඒවා මෙම පුවත් හසුනෙහි ස්වරූපයෙන් මුද්‍රිතව 'සංවාද' ශීර්ෂය යටතේ පාර්ලිමේන්තු සභිකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, මාධ්‍යවේදීන්, වෘත්තීය සමිති, වාණිජ මණ්ඩල, විද්වතුන්, ප්‍රජා සංවිධානයන් මෙන් ම උනන්දුවක් දක්වන අනෙකුත් රටවැසියන් අතට ද පත් වීම සඳහා නිකුත් කෙරෙන්නේ ය.

සංවාද සන්නිවේදන පත්‍රිකාවේ දෙවන ප්‍රකාශනය ඔබ අතට පත් කරන්නේ ඉතාමත් සතුටිනි.මෙම පත්‍රිකාව ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍යායතන විධිමත් කිරීම පිළිබඳ යෝජිත පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡා කරයි.මෙම සන්නිවේදන පත්‍රිකාව කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය එස්.පි ප්‍රේමරත්න විසින් සම්පාදනය කරන ලද විශ්ලේෂණාත්මක ලේඛනය මත පදනම්ව සකස් කරන ලදි. එකී සම්පූර්ණ ලේඛනය www.sanvada.org වලින් ලබා ගත හැක.

'සංවාද' සඳහා ඔබට අපි සාදරයෙන් ආරාධනය කරමු. එසේ ම වැඩසටහනෙහිත් මෙම පුවත් හසුනෙහි අන්තර්ගතයන්හිත් ප්‍රවර්ධනය පිණිස ඔබ ගේ සංස්කරණාත්මක විවේචනයන් ද අපේක්ෂා කරමු. ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයෙහිත්, එසේ ම රටෙහි ආයතනික, සමාජමය, ආර්ථිකමය හා දේශපාලනමය පරිපාලන කාර්යයන්හිත් සාධනීය වෙනස්කම් පිණිස ඉවහල් වන සේ පාර්ලිමේන්තුව තුළ හා ඉන් බැහැර කතිකාවන් සහ මහජන සාකච්ඡාවන් ඉහළ ප්‍රමිතියකට ගෙන ඒම සඳහා අපි එක්ව ක්‍රියාත්මක වෙමු.

පාත්ෆයින්ඩර් පදනම

දුරකතන : 2596281 ෆැක්ස් : 2595894
ඊ මේල් : info@pathfinderfoundation.org
අන්තර්ජාල අඩවිය : www.sanvada.org

සංස්කාරක සහාය : ශාමිලා දළුවත්ත, ව්‍යාපෘති කළමණාකාර